ලංකාදීප සුව+ සෙවණ

# හිසරදය වෙන ලෙඩක ලක්ෂණයක්ද?

**හිසරදය විවිධ හේතු නිසා බොහෝ දෙනාට සෑදෙන අපහසුතාවකි. එකවරක් හෝ මෙම අපහසුතාවට මුහුණ නොදුන් කෙනෙක් නැත. ඒ තරමට මෙම තත්ත්වයට මිනිසා ගොදුරු වෙයි.**

හිසරදය වෙනත් රෝගයක ප්‍රධාන ලක්ෂණයක් නිසාද ඇතිවේ. එසේම ප්‍රධාන රෝගයක් නිසාත් මෙම අපහසුතාව පෙන්නුම් කරයි. එනිසාම හිසරදයක් නිතර සෑදේ නම් ඒ ගැන දැනුවත් විය යුතුය.

හිසරදයක් ඇති වීමට නොයෙක් හේතු බලපායි. අපේ හිස් කබල තුළ තිබෙන්නේ සීමිත ඉඩ ප්‍රමාණයකි. ඒ තුළ මොළය CSF නම් තරලය සහ මෙනිංජී පටක (මොළය වටා ඇති සිවිය) තිබේ. මෙම ඉහත සඳහන් කළ කුමන පටකයක ප්‍රමාණය වැඩි වුවත් පීඩනය වැඩිවේ. ඒ මෙසේය.

## හේතු

කපාල කුහරය තුළ ඇතිවන රෝග.

කපාල කුහරයට පිටතින් ඇති රෝග.

මෙම සියලු රෝග නිසා හිස් කබල තුළ පීඩනය වැඩිවේ.

## කපාල කුහරය තුළ ඇතිවන රෝග මොනවාද?

මොළයේ ඇතිවෙන ආසාදන නිසා මොළය තුළ සැරව ඇතිවී කපාල කුහරය තුළ පීඩනය වැඩිවේ. මෙය උදාහරණ ලෙස සඳහන් කළොත් හිස් කබල තුවාලවී ඇති වන ආසාදන හේතුවෙන් කනේ ආසාදන ඇතිවීමෙන්, නාසයේ පීනස් කෝටරය ආසාදන හේතුවෙන් සහ මොළය වටා පිහිටි මෙනිංජී පටක හරහා මොළයට ගමන් කර පැසවීමට පුළුවනි.

හිසට සිදුවන අනතුරු නිසා කපාල නම් කුහරයට රුධිරය ගැලීම හේතුවෙන් ඒ තුළ පීඩනය වැඩිවේ. මෙම තත්ත්වය අනතුරක් නොමැතිව වුවද ඉබේ ලේ නහර පිපිරීමෙන් සිදුවිය හැකිය.

> **"කෝටරක ප්‍රදාහය, ස්නායු රෝග සහ රුධිරවාහිනී සම්බන්ධ ගැටලු නිසාත් පුද්ගලයාට හිසරදය ඇති විය හැකිය. උදාහරණ ලෙසට ඉරුවාරදය (migraine), පොකුරු හිසරදය (Cluster Headache) ආතති හිසරදය යන දෑ නිසාත් හිසරදය ඇති විය හැකිය.**



මොළයේ ගෙඩි හට ගැනීම නිසා මොළය වටා ඇති සිවිය සහ මොළය අතර මස්තිෂ්ක සුසුම්නා තරලය අතර ගැටලු ඇති වීමෙන්, මෙම තත්ත්වය බොහෝ විට ඇතිවන්නේ මොළයේ ගෙඩි පිළිකා හෝ අනතුරු නිසාය.



■ ශ්‍රී ලංකා ජාතික රෝහලේ උගුර, කන, නාසය පිළිබඳ වෛද්‍ය විශේෂඥ

**චන්ද්‍රා ජයසූරිය**

කපාල කුහරය තුළ පීඩනය වැඩිවූ විට ඇතිවන හිසරදය සාමාන්‍ය හිසරදයට වඩා වෙනස්ය. මෙම හිසරදය වේදනා නාශක ඖෂධ ගත්තත් අඩුනොවී දිගටම පවතී. රෝගියාට රාත්‍රී නින්දේදීත් හිසරදය පවතී. එනිසා නින්දෙන් අවදි වේ. සමහර විට උදය අවදිවන්නේද තද හිසරදය නිසාය. එසේම රෝගියාට වමනය හෝ වලිප්පුව ඇති විය හැක.

ඉහත රෝග ලක්ෂණ පවතී නම් කපාල කුහරය තුළ ඇති රෝග නිසා ඇතිවන හිසරදයක් බවට සැක කළ හැකිය. මෙවැනි තත්ත්වයකදී රෝගියා CT හෝ MRI පරීක්ෂණ සඳහා යොමු කරයි. මෙවැනි රෝග ලක්ෂණ පවතී නම් පමා නොකර ස්නායු ශල්‍ය වෛද්‍යවරයකු හමුවිය යුතුය.

## දත් රෝග නිසා ඇතිවන හිසරදය

දත් රෝගයක් සෑදී තිබෙන විටද හිසරදය ඇතිවේ. ඕනෑම දතක ආසාදනයකදී හෝ මුඛයේ අවසාන චාර්වක දත් හතරේ ගැටලුවලදී හිසරදය ඇතිවේ. මේ නිසා දන්ත වෛද්‍ය උපදෙස් ගැනීමත් වැදගත්ය.

## ඇස් රෝගවලදීත් හිසරදය හැදෙනවාද?

ඇස් පෙනීම ක්‍රමයෙන් අඩුවී යනවිට රෝගියාට ඒ බව නොදැනේ. එහෙත් නිතර හිසරදය ඇති වන්නේ නම් දෑස් පරීක්ෂා කර ගැනීමත් ඉතාම වැදගත් වේ.

වයස අවුරුදු 40 පසු කළ විට ඕනෑම කෙනකුට ළඟ පෙනීම අඩුවේ. මෙය 'හතලිස් ඇඳිරිය' නම් වේ. මේ වයසේදී ඇසේ සුදඇති වීමටත් පුළුවන. එසේම ග්ලුකෝමා නම් රෝගය සෑදීමේ ආරම්භය වීමටත් ඉඩකඩ තිබේ. මෙනිසා සෑම කෙනකුම වයස අවුරුදු 40 දී දක්ෂ වෛද්‍යවරයකු හමුවී පරීක්ෂා කර ගැනීම ඉතාම වැදගත් වේ.

මේ හැර කෝටරක ප්‍රදහය, ස්නායු රෝග සහ රුධිරවාහිනී සම්බන්ධ ගැටලු නිසාත් පුද්ගලයාට හිසරදය ඇති විය හැකිය. උදහරණ ලෙසට ඉරුවාරදය (migraine), පොකුරු හිසරදය (Cluster Headache) ආතති හිසරදය යන දෑ නිසාත් හිසරදය ඇති විය හැකිය.

සටහන - **ශිරානි ගල්ලෑල්ල**